---

**එරාවූර් නගරය ප්‍රාදේශීය සභාව**

**මඩකලපුව දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2011 ජූනි 07 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2010 මාර්තු 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1:2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව එරාවූර් නගරය ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට එරාවූර් නගරය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

### 1:3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 බැංකු ගිණුම්

රු.185,446 ක් වූ බැංකු තැන්පතු වර්ෂ 8 කට වැඩි කාලයක් උපලබ්ධි නොවී පැවතුණු බව බැංකු සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විග්‍රහාත්මක පරීක්ෂණයකදී අනාවරණය විය.

#### 1:3:2 ගෙවිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 8 කට වැඩි කාලයක් වූ ගෙවිය යුතු ශේෂ රු.3,994,615 ක් විය.

#### 1:3:3 අනුකූල නොවීම්

1992 සැප්තැම්බර් 30 දිනැති අංක 1769 දරන සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ චක්‍රලේඛයට පටහැනිව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට සැලසුම් ඇඳීම් ගාස්තු රු.83,047 ක් ගෙවා තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2:1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,959,947 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.5,849,474 ක් විය.

### 2:2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම

සභාපති විසින් සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 1,895 | 773 | 9,688 | 2,057 | 959 | 8,628 |
| (ii) | බදු කුලී | 2,676 | 2,062 | 2,162 | 4,348 | 4,079 | 2,300 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,182 | 467 | 974 | 692 | 787 | 578 |
| (iv) | වෙනත් ආදායම් | 2,508 | 3,145 | 101,237 | 22,596 | 23,950 | 1,713 |

### 2:3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ ඇස්තමේන්තුගත වියදම, තථ්‍ය වියදම හා විචලනය පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| **පුනරාවර්තන වියදම** | | | | | | |
| පුද්ගලික පඩිනඩි | 22,704 | 20,970 | 1,734 | 21,106 | 18,535 | 2,571 |
| වෙනත් | 4,859 | 3,138 | 1,721 | 4,838 | 3,278 | 1,560 |
| උප එකතුව | 27,563 | 24,108 | 3,455 | 25,944 | 21,813 | 4,131 |
| මූලධන වියදම | 22,914 | 9,530 | 13,384 | 5,737 | 3,947 | 1,790 |
| මුළු එකතුව | 50,477 | 33,638 | 16,839 | 31,681 | 25,760 | 5,921 |

## 2:4 මානව සම්පත් කළමණාකරණය

### අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය

සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | 2010 දෙසැම්බර් 31 දිනට අනුමත | 2010 දෙසැම්බර් 31 දිනට තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 01 | 01 |
| ද්විතීය ශ්‍රේණිය | 20 | 19 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 65 | 51 |
| වෙනත් (අනියම් / තාවකාලික) | - | 25 |
| | 86 | 96 |

## 2:5 වත්කම් කළමනාකරණය

### 2:5:1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශෙෂ රු.1,166,957 ක් විය.

**2:5:2 අයවිය යුතු සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 03 කට වැඩි කාලයක් ඉක්ම වූ අය කරගත යුතු සේවක ණය ශේෂ එකතුව රු.266,707 ක් විය.

**2:5:3 සමීක්ෂණය නොකළ වත්කම්**

2010 දෙසැම්බර් 31 දිනට භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොගෙන පොත්වල දැක්වෙන ශේෂය මත ගණනය කරන ලද වත්කම්වල වටිනාකම රු.40,835,467 ක් විය.

**2:6 හඳුනාගත් පාඩු හා හානි**

සභාව විසින් පවත්වා තිබුණු තොරතුරු සහ විගණන නියැදි පරීක්ෂණ අනුව රු.10,000 ක් වටිනා පුස්තකාල පොත් 200 කට පාඩු හා හානි සිදුවී තිබූ බව අනාවරණය විය.

**2:7 අභ්‍යන්තර විගණනය**

සභාව විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) ආදායම් පරිපාලනය